# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2313/69 – 2023 ජනවාරි මස 07 වැනි සෙනසුරාදා – 2023.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2021/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ලංකා බැංකු සේවක සංගමය, (එන්. එන්. එස්. සමරකෝන් මයා වෙනුවෙන්), අංක 20, පන්සල පාර, කොළඹ 10.
02. ලංකා බැංකු සේවක සංගමය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඉතිරිකිරීමේ මන්දිරය, අංක 255, ගාලු පාර, කොළඹ 03.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නුගේගොඩ, කන්දෙවත්ත පටුමග, අංක 24/ඒ, හි සී. එන්. විතානාච්චි මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

මනූෂ නානායක්කාර,
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

1A – G 38512 – 14 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/2021/141.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ලංකා බැංකු සේවක සංගමය, (එන්. එන්. එස්. සමරකෝන් මයා වෙනුවෙන්), අංක 20, පන්සල පාර, කොළඹ 10.
02. ලංකා බැංකු සේවක සංගමය, ජාතික ඉතිරිකිරීමේ බැංකුව, අංක 255, ගාලු පාර, කොළඹ 03.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ජාතික ඉතිරිකිරීමේ බැංකුව, ඉතිරිකිරීමේ මන්දිරය, අංක 255, ගාලු පාර, කොළඹ 03.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රවාහන කළමනාකරු වශයෙන් සේවය කළ එන්. එන්. එස්. සමරකෝන් මහතාට විරුද්ධව පවත්වන ලද විනය පරීක්ෂණයෙන් අනතුරුව, ලබා දී ඇති දඬුවම් මගින් අසාධාරණයක් සිදුව තිබේ ද? යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහනයන් කවරේද යන්නත් පිළිබඳ ව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 – 0047

---

මගේ අංකය: IR/COM/02/2021/34.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජේ. බී. නිශාන්ත මයා, උස්වත්ත, හිත්තැටිය නැගෙනහිර, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන.
02. ප්‍රාදේශීය සේවා මධ්‍යස්ථානය (දකුණ), ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, අංක 395, කුමාරතුංග මාවත, පඹුරණ, මාතර

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, නාවින්න, පරණ පාර, අංක 4/103, හි ගමගේ සිසිර ආනන්ද කෝදාගොඩ මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනුෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

මගේ අංකය: IR/COM/02/2021/34.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ජේ. බී. නිශාන්ත මයා, උස්වත්ත, හිත්තැටිය නැගෙනහිර, මාතර.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

01. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, ගාලු පාර, රත්මලාන.
02. ප්‍රාදේශිය සේවා මධ්‍යස්ථානය (දකුණ), ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, අංක 395, කුමාරතුංග මාවත, පඹුරණ, මාතර

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

''ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ ඉංජිනේරු සහකාරවරයෙකු ලෙස සේවය කරන (1941 අංක 27 දරන පඩිපාලක අඥාපනත පළමු කොටසින් ආවරණය වන) ජේ. බී. නිශාන්ත මහතාට ක්ෂේත්‍ර රාජකාරි කටයුතුවල නියැලීම වෙනුවෙන් අතිකාල සඳහා ගෙවීම් කිරීමේ දී සාප්පු හා කාර්යාල පනතට අනුව ගණනය කර ගෙවීම් කිරීම මඟින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ගණනය කළ යුතු ආකාරය හා හිමිවිය යුතු සහන කවරේ ද යන්න පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 නොවැම්බර් මස 30 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 – 0048

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.